// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2303/02 - 2022 ඔක්තෝබර් මස 25 වැනි අඟහරුවාදා - 2022.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 4-3/9/2018/WS/236.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: DS/VS/ACQ/WT/J-199/01.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තරය* :-

| | |
|---|---|
| මූලික පිඹුරු අංකය | : පිපියා 3006, |
| ඉඩම | : චුන්නාකම්, |
| ග්‍රාමසේවා වසම | : J/199, චුන්නාකම් නගරය, බටහිර, |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : වලිකාමම් දකුණ, උඩුවිල්, |
| දිස්ත්‍රික්කය | : යාපනය, |
| පළාත | : උතුර, |
| හේතුව | : යාපනය, කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ චුන්නාකම් ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම. |

01. කැබලි අංක **01**

ඉඩමේ නම: සොනවත්තකලට්ටි සොනවත්ත සහ තෙව්රානයි; ඉඩම් විස්තරය: වත්ත; හිමිකම් කියන්නා: මුරුගේසු සුන්තරරාජන් බිරිඳ ලිංගේස්වරි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0689.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.02.22 වැනි දින පූ.භා.10.00ට වාලිකාමම් දකුණ උඩුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2023.01.23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් තුනකින් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ටී. මුහුන්තන්,**
ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් දකුණ, උඩුවිල්.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,
උඩුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-0179


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*